# බුද්ධශාසන කාර්යසාධක මණ්ඩලය

(ආරම්භය ව.ව. 1988)

බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීමේත් බෞද්ධ ජනතාව සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමේත් පොදුවේ ජාතික, ආගමික හා සංස්කෘතික වැදගත් කමක් ඇති කරුණු පිළිබඳව පැනනැගෙන ගැටලු හා ප්‍රශ්න සොයා බලා වගකිව යුතු අංශවලට උපදෙස් ලබා දීමේත් පරමාධ්‍යාශයෙන් සංස්ථාපිත එක්සත් බෞද්ධ සංවිධානයකි.

380, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන ගොඩනැගිල්ල, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. ශ්‍රී ලංකාව. දුරකථන +94 11 2691695, / ෆැක්ස් +94 11 2688517


2565/2021.10.14

**<u>මාධ්‍ය නිවේදනය</u>**

**<u>වෙනම රාජ්‍යයක් සඳහා බෙදුම්වාදීන් ජාත්‍යන්තරය තුළ ගෙන යන කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙල රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් පරාජය කළ යුතුය.</u>**

මෑත වකවානුවක සිට බෙදුම්වාදී එල්.ටී.ටී.ඊ. හිතවාදී ක්‍රියාකාරිකයන් ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලංකාවට එරෙහිව සිදුකරමින් සිටින ක්‍රියාකාරකම් පිළිබඳව බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලයේ අවධානයට ලක් වී ඇත. ඉතාමත් සූක්ෂ්ම අයුරින් විවිධ තලයන්හි ක්‍රියාත්මක වන දීර්ඝකාලීන බෙදුම්වාදී සැලසුම් පිළිබඳව වර්තමාන රජයේ අවධානයට ලක් කර එම කුමන්ත්‍රණ ව්‍යර්ථ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගැනීමට යොමු කිරීමත් ඒ සඳහා අවශ්‍ය සහාය පළ කිරීමත් ශ්‍රී ලාංකිකයන් ලෙසින් සියලු ම ජනතාව එම ජාතික මෙහෙවර සඳහා පෙළ ගැස්වීමත් වහා සිදු කළ යුතු බව අවධාරණය කරමු.

මෙම වසරේ මැයි මස 12 වනදා කැනඩාවේ ඔන්ටාරියෝ ප්‍රාන්ත රාජ්‍යයේ පාර්ලිමේන්තුව මගින් සම්මත කොට නීතියක් බවට පත් කර ගත් ශ්‍රී ලංකාවේ **"දෙමළ ජන සංහාරය පිළිබඳ අධ්‍යාපනික සතිය"** නම් වූ පනත[1], ඇමෙරිකා එක්සත් ජනපදයේ කොන්ග්‍රස් මණ්ඩලයට 2021 මැයි මස 18 වනදා ඉදිරිපත් කර දැනට එහි ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කමිටුව මගින් සාකච්ඡාවට භාජනය කරමින් පවතින අංක **413** නම් වූ යෝජනාව සහ යුරෝපා සංගමය මගින් ජී.එස්.පී. සහනය ඉවත් නොකිරීම සඳහා කොන්දේසි ඉදිරිපත් කිරීම ආදී බලපෑම් බටහිර රටවල් මගින් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මෑතකදී ඒ වෙනුවෙන් කළ මැදිහත් වීම් ලෙස විශේෂයෙන් සඳහන් කළ හැක. මේවා එම රටවල පදිංචි එල්.ටී.ටී.ඊ. බෙදුම්වාදී ක්‍රියාකාරිකයන්ගේ සක්‍රිය දායකත්වය සහ මූලික මෙහෙයවීම මත සිදු වන්නක් බව සඳහන් කළ යුතුය.


උත්තරීතර අනුශාසක මණ්ඩලය : සියම් මහානිකායේ මල්වතු පාර්ශ්වයේ අතිපූජ්‍ය මහනාහිමිපාණන් වහන්සේ, සියම් මහානිකායේ අස්ගිරි පාර්ශ්වයේ අතිපූජ්‍ය මහනාහිමිපාණන් වහන්සේ, ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ අතිපූජ්‍ය උත්තරීතර මහනාහිමිපාණන් වහන්සේ, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අතිපූජ්‍ය මහනාහිමිපාණන් වහන්සේ

ක්‍රියාකාරී මණ්ඩලය : ආචාර්ය අතිපූජ්‍ය දිවියාගහ යසස්සි නාහිමි (ගරු සභාපති), ආචාර්ය අතිපූජ්‍ය ඉත්තෑපානේ ධම්මාලංකාර මහනාහිමි, අතිපූජ්‍ය දොඩම්පහළ චන්ද්‍රසිරි මහනාහිමි, පූජ්‍ය වැලම්ටියාවේ කුසලධම්ම නාහිමි, පූජ්‍ය බලන්ගොඩ සෝභිත නාහිමි, පූජ්‍ය මාතලේ ධම්මකුසල අනුනාහිමි, පූජ්‍ය අකුරටියේ නන්ද නාහිමි, සම්මානිත ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කන්දෙගොඩ විමලධම්ම අනුනාහිමි, මහාචාර්ය පූජ්‍ය මැදගම නන්දවංශ නාහිමි, පූජ්‍ය සිරි වජිරාරාමයේ ඤාණසීහ හිමි

ගරු සමලේකම්වරු : අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහනාහිමි, මහාචාර්ය පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි

ගරු සම්මානිත සාමාජික භවතුන් : ජගත් සුමතිපාල මහතා, සුරේන් අභයගුණසේකර මහතා, මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා, එම්.ඩී.ඩබ්. ආරියවංශ මහතා

ගරු භාණ්ඩාගාරික : සුමේධ අමරසිංහ මහතා, ගරු කමිටු සම්බන්ධීකාරක : පානි වැවල මහතා

සාමාජික සංවිධාන : සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, ධර්මවිජය පදනම, කොළඹ තරුණ බෞද්ධ සංගමය, කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය, ශාසන සේවක සමිතිය, මහාබෝධි සංගමය, සමස්ත ලංකා බෞද්ධ කාන්තා සම්මේලනය, බෞද්ධ සහයෝගිතා කේන්ද්‍රය, කළුතර බෝධි භාරකාර මණ්ඩලය, ජයග්‍රහණය කොළඹ, රාජ්‍ය සේවා බෞද්ධ සංගමය, ශාන්ති පදනම, බෞද්ධ නීතිඥ සංගමය, දම්රිව් පදනම, සම්බන්ධීකරණ ලේකම් : බී. ඇම්. ජයතිස්ස මහතා

පෞද්ගලික යෝජනාවක් ලෙසින් දෙමළ ජාතික **විජේ තනගසලම්** නම් වූ මන්ත්‍රීවරයා විසින් 2019 වසරේ අප්‍රියෙල් මස 30 දින ඔන්ටාරියෝ ප්‍රාන්ත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර 2021 වසරේ මැයි මස 12 වනදා නීතියක් බවට පත් වූ **“දෙමළ ජන සංහාරය පිළිබඳ අධ්‍යාපනික සතිය”** නම් වූ පනතේ **වසර 1948 දී ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් අනතුරුව සිංහල, බෞද්ධ කේන්ද්‍රීය රාජ්‍ය ප්‍රතිපත්ති**, වැඩසටහන්, ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම සහ ජනවාර්ගික පිරිසිදු කිරීම (ethnic cleansing) මගින් මෙම වර්ග සංහාරය සිදු කළ බව අවධාරණය කරයි. මෙම පනත අනුව **සෑම වසරකම මැයි 18 වනදායින් අවසන් වන සතිය “දෙමළ සංහාරය”** පිළිබඳව **සාකච්ඡා, සම්මන්ත්‍රණ, රැස්වීම්** ආදිය පවත්වමින් සමාජය දැනුම්වත් කිරීම සහ පාසල් දරුවන් හට එම **මහා අපරාධය** සිදු වූ බව ඉගැන්වීම සිදු කිරීමට ඒ අනුව බලාපොරොත්තු වේ. එවන් වූ වැඩපිළිවෙලක් තුළින් කැනඩාවේ පදිංචි ශ්‍රී ලාංකික සම්භවයක් ඇති බහුතර ජනතාව මුහුණ දෙන ගැටලුකාරී තත්ත්වයත්, රටක් වශයෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ මුහුණ දෙන අපකීර්තියත්, ඒ සමග බැඳුණු අසත්‍ය යුද අපරාධ චෝදනාවන්ට ලබා දෙන නීත්‍යානුකූල බවත් නිසා මෙම පනත එල්.ටී.ටී.ඊ. බෙදුම්වාදීන්ගේ වෙන ම රාජ්‍යයක් සඳහා වූ ගමන් මගෙහි සුවිශේෂී වූ සන්ධිස්ථානයක් වන බව අප හට ඉතා පැහැදිලි ය.

මෙම පනතේ සාර්ථකත්වය මත කැනඩාව තුළ පිහිටි අනෙකුත් ප්‍රාන්තයන් සේ ම දෙමළ බෙදුම්වාදීන් බහුලව වාසය කරන යුරෝපයේ සහ වෙනත් රටවල් තුළ මේ ආකාරයේ ම අනපනත් සම්මත කර ගැනීමට පවතින සූදානම පිළිබඳව අප හට දැනටමත් කරුණු වාර්තා වී ඇත. එමගින් බෙදුම්වාදීන් හට අවියෙන් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූ වර්ගවාදී ඊළාම් සිහිනය ලෝක බලවතුන් සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ රාජ්‍ය තාන්ත්‍රික මැදිහත් වීම් මගින් යථාර්ථයක් බවට පත් කර ගැනීම ඔවුන්ගේ උත්සාහයයි. එම පනතේ පූර්විකාවේ සඳහන් පරිදි වසර 2009 දී පමණක් දෙමළ වැසියන් 40,000 ක් 75,000 ක් අතර පිරිසක් ඝාතනයට ලක්වූ බවත් එලෙස ඝාතනයට ලක්වූ මුළු පිරිස 146,679 ක් බවත් පෙන්වා දෙයි. දෙමළ ජාතිකයන් හට තම ජාතිකත්වය නිසා රට තුළ රාජ්‍ය සේවයෙහි සහ අනෙකුත් සේවාවන්හි සමාන අයිතිය නොලැබුණු බවත් අඩුකොට සැලකීම දිගින් දිගට ම පවතින බවත් එහි සඳහන් ය.

එක්සත් ජාතීන්ගේ වර්ග සංහාරය පිළිබඳ සම්මුතියේ[2] දෙවන වගන්තියේ සඳහන් පරිදි **වර්ග සංහාරය** යනු යම් ජන වර්ගයක් ,ජාතියක්, ආගමික කණ්ඩායමකට අයත් පිරිසක් මරා දැමීම, බරපතළ ලෙස ශාරීරික හා මානසික හානි සිදු කිරීම, හිතාමතාම ඔවුන්ගේ ජීවන තත්ත්වයට හානි කිරීම, ශාරීරික වශයෙන් දුබලතාවට පත් කිරීම, උපත් පාලනය කිරීම, බලහත්කාරයෙන් ළමයින් එක් ජන කොට්ඨාසයකින් තවත් ජන කොට්ඨාසයකට මාරු කිරීම ලෙස අර්ථකථනය කර ඇත. මෙහිදි එක් ජන කොට්ඨාසයක් යන්නෙහි දී මුළුමනින්ම ජන කොටස හෝ එහි කොටසක්ද සංහාරයට ලක් කිරීම අදහස් කෙරේ. මෙවැනි තත්වයක් ශ්‍රී ලංකාව තුළ දෙමළ ජනතාවට එරෙහිව පැවතුණු බව ප්‍රකාශ කිරීම වගකීම් විරහිත අසත්‍ය ප්‍රකාශයකි.මෙවැන්නක් ප්‍රබල රාජ්‍යයක නීතියක් බවට පත් වීම දක්වා වර්ධනය වීමට ඉඩ නොදිය යුතුය. ඒ පිළිබඳව රාජ්‍යතාන්ත්‍රික ලෙස ක්‍රියා කළ යුතු බව රජය වෙත දැන්වීමට බුද්ධශාසන කාර්යසාධක මණ්ඩලය ඒකමතිකව තීරණය කරයි.

ශ්‍රී ලංකාවට එරෙහිව ඔන්ටාරියෝ ප්‍රාන්තයේ පාර්ලිමේන්තුවේ සම්මත වී ඇති පනත නීති පොතට ඇතුළත් වුව හොත් පහත සඳහන් අනිටු අසාධාරණ ප්‍රතිවිපාකවලට රටක් ලෙසින් මුහුණ දීමේ අභියෝගය අප අභිමුවෙහි ඇත

සමස්ත ලංකා

- කැනඩාවේ ඔන්ටාරියෝ ප්‍රාන්තය තුළ ශ්‍රී ලංකාවේ දෙමළ ජන සංහාරයක් සිදු වූ බව නිල වශයෙන් පිළිගැනෙනු ඇත.
- කැනඩාව තුළ පවතින අනෙකුත් ප්‍රාන්ත රාජ්‍යයන් තුළ ද මෙවන් වූ නීති සම්මත කර ගැනීමට බෙදුම්වාදීන්ට අවස්ථාව සැලසෙනු ඇත.
- අවසානයේදී කැනඩා ෆෙඩරල් රජය මගින්ද ශ්‍රී ලංකාවේ දෙමළ ජන සංහාරයක් සිදු වූ බව නිල වශයෙන් පිළිගැනෙනු ඇත.
- මානව හිමිකම් කවුන්සිලය මගින් ශ්‍රී ලංකාවට එරෙහිව මේ වනවිට උත්සන්න කර ඇති මානව හිමිකම් කඩකිරීමේ සහ යුද අපරාධ චෝදනා සනාථ කිරීම සඳහා අවශ්‍ය පදනම මෙ මගින් ශක්තිමත් වනු ඇත.
- දෙමළ බෙදුම්වාදීන් බහුල ලෙස ජීවත්වන සියලුම රටවල් කැනඩා ආදර්ශය අනුව යමින් ශ්‍රී ලංකාවට එරෙහි නීති සම්මත කරනු ඇත. 2021 සැප්තැම්බර් 24 දින ඉතාලියේ පලර්මෝ නගර කවුන්සිලය සමග දෙමළ බෙදුම්වාදීන් වාර්ගික සංහාරය සැමරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමට අත්සන් කිරීමෙන් මෙම කරුණ සනාථ වේ[2].
- පනතේ සඳහන් පරිදි සෑම වසරකම මැයි මස 18 වනදායින් අවසන් වන සතියක කාලය අසත්‍ය මත පදනම්ව සිදුවූවායයි සඳහන් වර්ග ඝාතනය පිළිබඳ ඉගැන්වීම් හේතුවෙන් කැනඩාවේ මෙන්ම ශ්‍රී ලංකාව තුළත් සිංහල, දෙමළ සම්බන්ධතාව පලුදු වනු ඇත.
- කිසියම් ජනවර්ගයකට තමන් සඳහා ම වූ වෙන ම පාලන ප්‍රදේශයක් පිළිබඳ ස්වයං තීරණ අයිතිය සාධාරණීයකරණය කිරීම සඳහා ජාත්‍යන්තර නීතිය යටතේ පවතින ප්‍රතිපාදනයන් අනුව වාර්ගික සංහාරයට ලක් වීම, වෙනස් කොට සැලකීම ආදිය සැලකිල්ලට ගනුඇත. මේ සියලු ක්‍රියාවන් අනාගත ඊළම් රාජ්‍යයක් උදෙසා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමේ දීර්ඝ කාලීන සැලසුමේ ප්‍රධාන ක්‍රමෝපාය වනු ඇත.
- 1948 සිට ශ්‍රී ලංකාව තුළ පැවති රජයන් විසින් දෙමළ වාර්ගික සංහාරයක් සිදු කළ බවට, කැනඩාවේ පාසල් තුළ ලබා දෙන අධ්‍යාපනය මගින්, අනාගතයේ දී රාජ්‍යතාන්ත්‍රික තීරණ ගන්නා වර්තමාන දූදරුවන්ගේ සිත් තුළ ශ්‍රී ලංකාව කෙරෙහි විරෝධයක් ඇති වීම නොවැළැක්විය හැකි ය. එමගින් ඊළාම් ගමන් මග ශක්තිමත් වනු ඇත.
- කැනඩාවේ පාසල් තුළ අධ්‍යාපනය ලබන සිංහල දරුවන් පවා තම ජාතිකත්වයට වෛර කරන පිරිසක් බවට පත් වනු ඇත. අන් සිසුන් අතර ඔවුන් පිළිකුලට භාජනය වනු ඇත.
- කැනඩාවේ වෙසෙන සිංහලයන් තමන්ගේ රැකියා ස්ථාන තුළ සහ එරට ජන සමාජයෙන් නින්දා සහගත ලෙස පිළිකුලට භාජනය වීම, සමාජය තුළ පිළිගැනීමට ලක් නොවීම පමණක් නොව ශ්‍රී ලංකාව වෙනුවෙන් ඉදිරිපත්ව කටයුතු කිරීමට ශ්‍රී ලංකා ප්‍රජාව පසුබට වනු ඇත.
- මෙම මිථ්‍යාවෙන් සමාජයේ සෑම කොටසක් ම ආවරණය කිරීම තුළින් සියල්ලන්ගේම අනුකම්පාව දිනා ගැනීම, එමගින් ඔන්ටාරියෝ ප්‍රාන්තයේ බලයට පත් වීමට අදහස් කරන සෑම දේශපාලන කණ්ඩායමක් සමගම කේවල් කිරීමේ ශක්තිය තහවුරු කර ගැනීම සහ බලයට ගෙන ඒමෙන් පසු බෙදුම්වාදය වෙනුවෙන් පාලකයන් මෙහෙයවීමට ද බෙදුම්වාදීන් සමත් වනු ඇත.

මීට අමතරව ඇමෙරිකා එක්සත් ජනපදයේ කොන්ග්‍රස් මණ්ඩලයේ ජාත්‍යන්තර කටයුතු කමිටුවේ අධ්‍යයනයට යොමු කර ඇති අංක 413 නම් යෝජනාව මගින් ඊළාම් බෙදුම්වාදීන්ගේ මූලික පදනම වන නිජ භූමි සංකල්පය පිළිගෙන ඔවුන් විසින් ම මිනීමරු ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කර තහනම් කරනු ලැබේ. එල්.ටී.ටී.ඊ. සංවිධානය නිදහස පතා සටන් කරන විමුක්තිකාමීන් ලෙස නම් කිරීම ශ්‍රී ලංකා රාජ්‍යයට එල්ල කරන ලද බරපතළ අභියෝගයකි. සෑම දෙමළ වැසියන් දෙදෙනෙකුටම එක හමුදා භටයකු සිටින බවත් උතුරු ප්‍රදේශය හමුදාකරණයට ලක් කර ඇති බවත් කියති. වෙන්ව පවතින උතුර සහ නැගෙනහිර පළාත් එම යෝජනාවේ

---

බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

සඳහන් වනුයේ උතුරුනැගෙනහිර පළාත යනුවෙනි. මේ ආකාරයෙන් ශ්‍රී ලංකා රාජ්‍යයට එරෙහිව ගොඩනැඟෙන බාහිර බලවේගවලට ශක්තිමත්ව ප්‍රබල අයුරින් ප්‍රතිචාර දැක්වීමෙහිලා රජය දක්වන උදාසීන භාවය පිළිබඳව මහා සංඝරත්නය සහ සියලුම බෞද්ධ සංවිධාන නියෝජනය කරන බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලයේ කනස්සල්ලට හේතු වී ඇත. මෙම වැදගත් කරුණ පිළිබඳව ප්‍රමාණවත් සාකච්ඡාවක් වර්තමාන ආණ්ඩුවේ පක්ෂ විපක්ෂ මහජන නියෝජිතයන් අතර තවමත් දකින්නට නොලැබීම රටේ ඒකීය භාවය ආරක්ෂා කර ගැනීමෙහි ලා ඔවුන් සතු පරම යුතුකම පැහැර හැරීමක් බව ප්‍රකාශ කරමු.

එමෙන්ම ශ්‍රී ලංකාව වෙනුවෙන් ඉදිරිපත් වන දේශප්‍රේමීන් දඩයම් කිරීමද බෙදුම්වාදීන්ගේ අලුත්ම උපක්‍රමය වී ඇති බව යස්මින් සූකා විසින් එංගලන්තයේ සිට ක්‍රියාත්මක වන දේශප්‍රේමී ක්‍රියාකාරිකයකුට විරුද්ධව පවරා ඇති නඩුව මගින් සනාථ වේ. ශ්‍රී ලංකාව වෙනුවෙන් ඉදිරිපත් වන ක්‍රියාකාරිකයන් රැක ගැනීම රජයේ හා ශ්‍රී ලාංකිකයන්ගේ වගකීමක් වන බවද සඳහන් කරමු.

ගෝලීය ශ්‍රී ලාංකික සංසදය මගින් වර්තමාන ජාත්‍යන්තරයේ මතුව ඇති මෙම අර්බුධකාරී ප්‍රශ්නය වෙනුවෙන් ඉදිරිපත් කරණ යෝජනා ද සැලකිල්ලට ගනිමින් බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලය විසින් මෙහිලා ඒකමතික ව යෝජනා කරනු ලබන්නේ රජය කල් නොයවා පහත සඳහන් ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ ව තත්ත්වය පාලනය කල යුතු බවය.

- අසත්‍ය කරුණු මත පදනම් ව කැනඩාවේ ඔන්ටාරියෝ ප්‍රාන්ත පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වෛරී භාවයට අභියෝග කරන **'දෙමළ ජන සංහාරය පිළිබඳ අධ්‍යාපනික සතිය'** නම් වූ පනතට විරෝධය පළ කරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ යෝජනාවක් සම්මත කිරීම.

- කැනඩාවේ ෆෙඩරල් රජය සමග පනත අවලංගු කිරීම සඳහා ඉහළම රාජ්‍යතාන්ත්‍රික මට්ටමින් අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- රජය මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මහා සංඝරත්නය ඇතුළු ජනතාව දැනුම්වත් කිරීම.
- මින් ඉදිරියට ශ්‍රී ලංකාවට එරෙහිව ජාත්‍යන්තරය තුළ ක්‍රියාත්මක නගින විවිධ බලවේගවලට මුහුණ දීමට අවශ්‍ය රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියමාර්ග සම්පාදනය කිරීමට ලේකම් කාර්යාලයක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම.

ශ්‍රී ලංකාවට එරෙහිව දැනට පැන නැගී ඇති ඉතා අහිතකර ජාත්‍යන්තර ප්‍රවණතාව ගැන සැලකිල්ලට ගෙන සත්‍ය තත්ත්වය ලෝකයට පෙන්වා දීමට ක්‍රියාශීලි කඩිනම් වැඩපිළිවෙලක් ශ්‍රීමත් ජනාධිපතිතුමා ප්‍රධාන රජය විසින් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය බව අපි අවධාරණය කරමු. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද පිළිගෙන ඇති පරිදි ශ්‍රී ලංකාව තුළ සැමටම සතුටින්, සමාදානයෙන් සහ සහජීවනයෙන් වාසය කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පදනම ස්ථාවරව පිහිටුවිය යුතු බව ද අවධාරණය කරමු.

මෙයට,

දිවියාගහ යසස්සි නායක ස්ථවිර
ගරු සභාපති

තිරිකුණාමලයේ ආනන්ද මහානායක ස්ථවිර මහාචාර්ය අගලකඩ සිරිසුමන ස්ථවිර

ගරු සමලේකම්වරු

## References

1 https://www.ola.org/en/legislative-business/bills/parliament-42/session-1/bill-104

**2.** Convention on the Prevention and Punishment of the Crime of Genocide Approved and proposed for signature and ratification or accession by General Assembly resolution 260 A (III) of 9 December 1948 Entry into force: 12 January 1951, in accordance with article XIII

> **"Article II - Definition of Genocide**
>
> In the present Convention, genocide means any of the following acts committed with intent to destroy, in whole or in part, a national, ethnical, racial or religious group, as such:
>
> (a) Killing members of the group;
>
> (b) Causing serious bodily or mental harm to members of the group;
>
> (c) Deliberately inflicting on the group conditions of life calculated to bring about its physical destruction in whole or in part;
>
> (d) Imposing measures intended to prevent births within the group;
>
> (e) Forcibly transferring children of the group to another group."

**3.** https://www.tamilguardian.com/content/palermo-city-italy-recognises-genocide-eelam-tamils